ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතය - 2022

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ (මණ්ඩලය) සහ එහි පරිපාලිතය ඇතුළත් සමූහයෙහි ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ ප්‍රකාශන සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ එහි පරිපාලිතය ඇතුළත් සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත යටතේ සහ 1979 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධාන යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික

සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන

1.5.1 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙහි ඉඩ දී ඇති අවස්ථාවලදී හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් නොකළ යුතු නමුත්, මණ්ඩලය විසින් රු. 11,672,548 ක මූල්‍ය වියදම් වලට එරෙහිව රු. 23,918,827 ක් වූ මූල්‍ය ආදායම් කපාහැර ශුද්ධ මූල්‍ය වියදම ලෙස රු. 12,246,279 ක් ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබුණි.	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය වියදම් වලට මූල්‍ය ආදායම් කපාහැරීමක් සිදුවී නොමැති අතර අදායම් ප්‍රකාශනයේ මුහුණත මූල්‍ය වියදම් හා මූල්‍ය ආදායම් අතර ශුද්ධ අගය පෙන්වා සටහන් අංක 07 යොදා ඇති අතර එම සටහන යටතේ මූල්‍ය ආදායම් සහ මූල්‍ය වියදම වෙන වෙනම නිරූපණය කර ඇත. විගණන වාර්තාවේ සඳහන් පරිදි 2023 වර්ෂයේ සිට ඉදිරිපත් කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව එකිනෙක ශේෂ හිලව් නොකළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි 15 හා 16 ඡේද අනුව මණ්ඩලය විසින් තාවකාලික අයකළ හැකි බදු වෙනස්කම් සැලකිල්ලට ගෙන සමාලෝචිත වර්ෂය සඳහා විලම්භිත බදු වත්කම් හෝ වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැළපිය යුතු වුව ද එසේ සිදුකර නොතිබුණි.	2025 වර්ෂයේ සිට මණ්ඩලය විසින් තාවකාලිකව අයකළ හැකි බදු වත්කම් සැලකිල්ලට ගෙන විලම්භිත බදු වත්කම් හෝ වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව බදු වෙනස්කම් ගැලපිය යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 50 හා 51 ඡේද අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායි ජීවකාලයක් ඇස්තමේන්තු කර ගිණුම්වල ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, පිරිවැය එකතුව රු. 428,821,164ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු ස්ථාවර වත්කම් මණ්ඩලය විසින් භාවිතා කරමින් පැවතියද ඒවායේ ඵලදායී ජීවකාලය සමාලෝචනය හා අදාල හෙළිදරව්ව සිදුකර නොතිබුණි.	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙම මූල්‍ය වර්ෂය තුල ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමට නොහැකි විය.මූල්‍ය තත්වය යහපත්වූ විගස අදාළ ප්‍රත්‍යාගණනයන් සිදුකිරීමට කටයුතුකරන බව දන්වමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව වත්කම් වල ඵලදායී ජීව කාලය සමාලෝචනය කර හෙළිදරව් කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41හි 5(අ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මණ්ඩලය සතු රු.2,379,113ක් වටිනා තේක්ක හා මහෝගනී වගාවන් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවද ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා තිබුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. නිවැරදි කිරීම් 2025 වර්ෂයේ සිට සිදු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව වත්කම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41හි 50 ඡේදය ප්‍රකාරව වර්ෂය ආරම්භය සහ අවසානය අතර ජීව විද්‍යාත්මක වත්කම්වල අගය වෙනස්වීම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු අතර සාධාරණ අගය වෙනස්වීම මත ඇතිවන ලාභ අලාභ, මිලදීගැනීම හේතුවෙන් ඇතිවන වැඩිවීම්, වත්කම් විකිණීම හෝ බැහැර කිරීම මත සිදුවන අඩු වීම් යනාදිය වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වුවද එලෙස වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර නොතිබුණි.	ජීව විද්‍යාත්මක වත්කම් වල අගය වෙනස්වීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් අංක 11.2.1 යටතේ දක්වන අතර එයට විගණන වාර්තාවේ සඳහන් පරිදි අදාළ අනෙකුත් තොරතුරු ඇතුලත් කර 2023 ගිණුම් වර්ෂයේ සිට ඉදිරිපත් කරන බව දන්වමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම්වල අගය වෙනස්වීම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.
(ඊ)	2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව පවතින රු.1,016,126,771ක් වූ පොල් වගාව ද, රු.1,961,831ක් වූ කජු වගාවද රු.38,142,373ක් වූ රබර් වගාවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 45 ඡේදය ප්‍රකාරව මේරූ හා නොමේරූ ලෙස වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ප්‍රකාරව කජු හා රබර් වගාවන් සඳහා ඊට අදාළ ක්ෂය ගැලපීම්ද සිදුකර නොතිබුණි.	විගණන වාර්තාව හා එකඟ වේ.නිවැරදි කිරීම් 2024 වර්ෂයේ සිට සිදු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කජු හා රබර් වගාවන් සඳහා ක්ෂය ගැලපීම් සිදු කළ යුතුය.

(උ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 07හි (14) ඡේදය අනුව වත්කම් ඇපයට තබා ලබා ගන්නා ලද ණය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී එසේ ලබා ගන්නා ලද එකතුව රු. 162,500,000 ක්වූ ණය පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය.
(ඌ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 හි 5.5.15 ඡේදය ප්‍රකාරව වෙළඳ ණයගැති ශේෂය වන රු. 193,335,673ක් සඳහා පසුකාලීන හානිකරණ හඳුනාගැනීම් මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා කළයුතු වුවත් එසේ ගණනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂයන්හි නිවැරදිතාවය විගණනයේදී තහවුරු නොවීය.	විගණන වාර්තාව හා එකඟවන අතර 2025 ගිණුම් වර්ෂයේ සිට අපේක්ෂිත ණය අලාභ ක්‍රමය භාවිතයෙන් අදාළ ගණනය කිරීම් සිදු කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව හානිකරණ නිවැරදිව ගණනය කළ යුතුය.

1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ වෙළෙඳ ණයහිමි ශේෂය තුල රු.10,505,472ක් ද, වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුල රු. 1,766,891 ක් ද, වශයෙන් හර ශේෂ පැවතීම සහ වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුල රු.1,188,619 ක බැර ශේෂ පැවතියද අදාළ ශේෂ හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරිමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් මුළු වෙළෙඳ ණයහිමි සහ වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය සහ වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. ගොවිපළ ගිණුම් පිළියෙළ කිරීමේදී ණය හිමි සහ ණයගැති ශේෂයන් තුල සෘණ ශේෂයන් ඇතුලත් කිරීම නිසා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මෙය සිදුව තිබේ.	මෙම හර හා බැර ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව මහබේරියතැන්න, මීරිස්වත්ත, හොරකැලේ සහ වැලිසර යන ගොවිපොළයන්හි තොග අයිතම 61කට අදාළව එකතුව රු.530,751ක තොග ඌණතාවය වෙනම ගිණුම්ගත නොකර විකුණුම් පිරිවැයට ගැළපුම්කර දක්වා තිබුණි.	මෙම තොග ඌණතාවය හඳුනාගැනීමෙන් පසු භෞතික තොගය ගණනය කර එම වටිනාකම මූල්‍ය වාර්තාවලට ඇතුලත් කිරීම මගින් අදාළ තොග ඌණතාවයන් සඳහා ගැළපීම් සිදුව ඇත.	තොග ඌණතාවයන් වෙනම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඈ)	මණ්ඩලයේ මහජන බැංකු ජංගම ගිණුමෙහි 2022 දෙසැම්බර් 31 දිනට රු.50,182,762 ක බැංකු අයිරා ශේෂය වෙනුවෙන් ඇප තබා ඇති ස්ථාවර තැන්පතු පිළිබඳව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	විගණන වාර්තාව හා එකඟ වේ.නිවැරදි කිරීම් 2024 වර්ෂයේ අවශ්‍ය හෙළිදරව් කිරීම් කිරීමට කටයුතු කරමි.	බැංකු අයිරා ශේෂය වෙනුවෙන් ඇප තැබීම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රාග්ධනය අත්පත් කර ගැනීමට අදාල මුදල් ගලා යෑම සහ ප්‍රාග්ධනය ඉවත් කිරීමට අදාල මුදල් ගලා ඒම් වෙන් වෙන් වශයෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කළයුතු වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පශු සම්පත් මණ්ඩලයේ ප්‍රාග්ධන වෙනස් වීම ලෙස රු. 208,168,887 දක්වා තිබුණි.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සතුන් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන ආදායමක් බැවින් එය බදු පෙර ලාභය තුල අන්තර්ගත කර ඇත.	ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් සහ ගලායාම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වගා කිරීම සඳහා ආයෝජනය කරන ලද මුදල රු.99,424,993ක් වුවද සටහන් අංක 11 යටතේ වගා කිරීම සඳහා දරන ලද වියදම රු.96,976,444ක් වූයෙන් රු. 2,448,549 ක වෙනසක් පැවතුණි.	මෙම වෙනසට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමෙන් 2022 වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.2,235,784 වටිනා පොල් වගා සහ රු.212,765 වටිනා කුරුඳු වගා ආයෝජනය වේ.	මුදල් ගලායාම් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඊ)	මණ්ඩලයේ වාර්ෂික පාරිතෝෂික වෙන්කිරීම් රු.15,856,618ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ශුද්ධ ලාභයට රු.17,109,443ක් ගැලපීම් කිරීම හේතුවෙන් රු.1,252,825ක වෙනසක් පැවතුණි.	විගණන වාර්තාව හා එකඟ වේ.	පාරිතෝෂික වෙන්කිරීම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපීම් කළ යුතුය.
(උ)	ඉදිරිපත් කරන ලද උපලේඛණය අනුව මණ්ඩලය විසින් 2022 වර්ෂයේ දී ගෙවා තිබුණු රු.22,816,374 ක්වූ සේවක පාරිතෝෂික දීමනා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද එය රු.8,936,846ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	2022 වර්ෂය තුල පාරිතෝෂිත ලෙස රු.22,816,374 ක් මුදලින් ගෙවා තිබුණද එම මුදලින් රු.13,879,528 ක් 2021 වර්ෂය සඳහා ගෙවිය යුතු පාරිතෝෂික මුදල වේ. එම ගෙවිය යුතු පාරිතෝෂික මුදල ජංගම වගකීම් යටතේ දක්වා ඇති බැවින් 2022 වර්ෂයේ ඒ වෙනුවෙන් කරන ලද ගෙවීම ඒ යටතේ දක්වා ඇත.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායාම් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඌ)	මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි බදු පෙර ශුද්ධ ලාභයට රු.13,434,424ක් වූ ආර්ථික සේවා ගාස්තු කපා හැරීමේ වියදම එකතු කර නොතිබුණි.	විගණන විමසුමේ සඳහන් කරුණ පිළිගන්නා අතර දැනට එය වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ ගැලපීම් කර ඇත.	ආර්ථික සේවා ගාස්තු කපා හැරීම නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීම් කළ යුතුවේ.

(එ)	ඉකුත් වර්ෂයේ පොළොන්නරුව ගොවිපොලෙහි එස්කැවේටර් යන්ත්‍ර සඳහා වැයකර තිබූ රු.1,343,518ක් වූ කුලී වියදම වත්කමකට හර කිරීම නිවැරදි කිරීමේදී ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.	විගණන වාර්තාව හා එකඟවේ. 2023 වර්ෂයේ ගිණුම් වාර්තාව තුළ අදාළ නිරූපනයන් නිවැරදි කර ඇත.	ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපීම් සිදු කළ යුතුය.
(ඒ)	ස්ථාවර වත්කම් ලේඛණයේ ගොඩනැගිලි ශේෂය තුළ ඇතුළත්ව ඇති 2004 වර්ෂයේ දී ප්‍රාග්ධනිත කරන ලද වැලිසර ගොවිපොළ යටතේ පැවති පිරිවැය රු.7,166,956 ක් වූ (Managers Bungalow No.12) සමාලෝචිත වර්ෂය වන විට අවුරුදු 18ක් දක්වා ක්ෂය කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට ආසන්න වශයෙන් අවුරුදු 11 ක් සඳහා පමණක් ක්ෂය කර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව, ගොඩනැගිලි ශේෂය රු.2,275,184 වැඩියෙන් දක්වා තිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනයේ ගොඩනැගිළි ශේෂය තුල ඇතුළත් වැලිසර ගොවිපලේ Managers Bungalow වටිනාකම 2012 වර්ෂය දක්වා රු. 289,127.43 වන අතර එහි 2012 වසරේ ජුනි මස 30 දින සිදුකරන ලද අලුත් වැඩියා වියදම වූ රු.6,877,828 2012 ජුනි මස 30 දිනට ස්ථාවර වත්කම් ලේඛනය තුල ප්‍රාග්ධනිත කර ඇති බැවින් විගණන විමසුමේ සඳහන් පරිදි ගොඩනැගිලි ශේෂයේ රු.2,275,184 වැඩියෙන් දක්වා නොමැති බව දන්වමි.	ක්ෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඔ)	2021 වර්ෂයේ දී දේපළ, පිරියත හා උපකරණ පිරිවැය ඉක්මවා ක්ෂය කිරීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අයිතම 05ක ශුද්ධ ශේෂයේ රු.2,156,386ක සෘණ වටිනාකම් පැවතුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්ෂය රු.2,156,386 කින් අඩුවෙන් දැක්වුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. අවශ්‍ය නිවැරදි කිරීම් 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත්කිරිමේදී නිවැරදි කර ඇත.	වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඕ)	වෙනත් වගාවන් යටතේ දක්වා ඇති රු.2,379,113ක් වටිනා ශාක සඳහා සාධාරණ අගය පිළිබඳ වාර්තාවක් (Plantation Valuation Report) ගොවිපළ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණු බැවින් එක් එක් ගොවිපළ සතු පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක ශාක වටිනාකම තහවුරු කරගත නොහැකි විය.	විගණන වාර්තාව සමඟ එකඟ වේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වගාවන් පිරිවැය මත පදනම්ව ගිණුම්කරණය කරනු ලබන අතර සාධාරණ අගයට අගයකිරීමක් සිදු කරනු නොලබන බැවින් එය විගණනය වෙත ලබාදීමට නොහැකි වී ඇත.	වත්කම් අගය කිරීමේ වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

(ක)	පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ උපලේඛණය අනුව 2013 වර්ෂය ආරම්භයේ පැවති එකතුව රු. 133,818,590 ආරම්භක ශාක වටිනාකම වෙන් වෙන් ගොවිපළ වශයෙන් දක්වා නොමැති බැවින් එම ශේෂයේ ඇතුළත් ශාක වටිනාකම තහවුරු කරගැනීමට නොහැකි විය.	එක් එක් ගොවිපළ වල ගස් වටිනාකම් පිළිබදව විස්තර 2013 වර්ෂයට පෙර නොතිබූ නමුත් 2014 වර්ෂයේ සිට මෙම ලේඛන පිළියෙළ කර නඩත්තු කරනු ලබයි.	සමීක්ෂණයක් සිදු කර එක් එක් ගොවිපලවල පවතින ශාක පිළිබඳ නිවැරදි ලේඛණයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(කා)	ගොවිපොළ මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලය සතු ගොවිපොළ 04කට අදාළව එකතුව රු.2,203,360ක් වටිනා තෘණ වගා ශේෂය සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි රු.1,328,079ක් ලෙස අනෙකුත් වගාවන් යටතේ හඳුනාගැනීම හේතුවෙන් රු.875,281ක වෙනසක් පැවතුණි.	මහබෙරියතැන්න ගොවිපලේ රු. 74,402 ක තෘණ වියදමේ වෙනසක් තිබෙන බව පිළිගනු ලබන අතර අනෙකුත් ශේෂයන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගොවිපළ වල දත්ත නිරූපනය කිරීමේදී සිදුවී තිබෙන දෝෂයක් වේ.	ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(කැ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව පොල් වගාව සහ තෘණ වගාව සඳහා ක්‍රම ක්ෂය රු.4,276,185ක් සහ රු.3,937,547ක් වුවද මණ්ඩලය සතු එම ශාකවල ආයු කාලය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එක් එක් වගාවන්ට අදාළව ක්‍රම ක්ෂය වටිනාකමෙහි නිවැරදිතාව තහවුරු කරගැනීමට නොහැකි විය.	මණ්ඩලයට පොල්වතු පවරාදුන් අවස්ථාවේ සිට පොල් වගාවන් වල ආයුකාලය වාර්තා නොවීම මත මෙම ගැටලුව ඇති වී ඇත.	අයුකාලයන් ගණනය කර වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(කෑ)	පොල් වගාවක් මඟින් වසර 07ක් ඇතුළත ප්‍රතිලාභ ලැබීම ආරම්භවන බව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණ ද උපලේඛණය අනුව 2015 වර්ෂයේ දී මේරූ ශාක ලෙස හඳුනාගන්නා ලද රු.3,484,071ක් වූ පොල් වගාව සඳහා සමාලෝචිත වර්ෂයේදී ක්‍රම ක්ෂය හඳුනා නොගෙන ඉකුත් වර්ෂයේ දී වෙන්කර තිබුණු රු.4,276,185ක වටිනාකමම සමාලෝචිත වර්ෂය සඳහාද වෙන්කර තිබුණි.	පොල් වගාව සම්බන්ධයෙන් සිදු කලයුතු ක්‍රම ක්ෂය සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලින කරගෙන යමින් පවතින අතර ඒ අනුව ඉදිරියේදී මෙම වරද නිවැරදි වනු ඇත.	ක්‍රමක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(කි)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශයෙහි ජීව විද්‍යාත්මක වත්කම්වල (සතුන්) වටිනාකම් දැක්වීමේදී වර්ෂය අවසානයේ සියළු සාධක සලකා බැලීමෙන් පසු සාධාරණ අගයකට අගය කර තිබූ අතර එම සතුන්ගේ වසර අවසාන වටිනාකමින් උපලබ්ධි නොවීමේ සම්භාවිතාවය වෙනුවෙන් නැවතත් සියයට 10ක ප්‍රමාණයක් හෙවත්, රු.145,432,621 අඩුකර දක්වා තිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41 අනුව සතුන් සාධාරණ අගයකට ශේෂ පත්‍ර දිනට අගය කිරීමෙන් පසු එම මුළු සතුන් ප්‍රමාණයම ගිණුම්කරණ කාලපරිච්ඡේදයෙන් පසු උපලබ්ධි නොවීමේ හැකියාවක් ඇත. එය මුළු වටිනාකමෙන් 10%ක් බව ගිණුම්කරණ ප්‍රතිපත්ති තුල හෙළිදරව් කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව ගණනය කළ යුතුය.

(කී)	බෝපත්තලාව ගොවිපොළෙහි කිරිගවයන් 172ක් ආගණනයේදී එම සතුන්ගේ වටිනාකම ආයතනයේ සතුන් අගය කිරීමේ ක්‍රමවේදයට පටහැනිව දෛනික සාමාන්‍ය කිරි නිෂ්පාදනය ලීටර් 10 ලෙස සලකා රු.16,643,502ක් වශයෙන් ගණනය කර තිබුණි. කිරි ගවයන්ගේ සත්‍ය කිරි නිෂ්පාදනය වෙනුවට එලෙස සාමාන්‍ය අගය යොදා ගැනීම දෝෂ සහිත බැවින් මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්වෙන සතුන්ගේ වටිනාකම් අධි හෝ ඌණ ගණනය වී තිබුණි.	වරදක් සිදුවී ඇති බව පිළිගන්නා අතර ඊලඟ මූල්‍ය වර්ෂයේ සිට නිවැරදි කර ඇත.මේ සම්බන්ධයෙන් අදාළ නිළධාරීන් දැනුවත්කර ඇත.	සතුන්ගේ වටිනාකම නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(කෙ)	2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව රු.5,946,213,874 ක මුළු වත්කම්ද රු.1,176,325,794 ක මුළු වගකීම්ද රු. 4,769,888,080 ක හිමිකම් ශේෂයක්ද පැවති අතර විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී එක් එක් ගොවිපොළවල් වල මූල්‍ය ප්‍රකාශන, ලෙජර ගිණුම්, උපලේඛන හා ගොවිපොළවල් වල ශේෂ පිරික්සුම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර තිබූ නමුත් සමූහය සඳහා ඒකාබද්ධ ශේෂ පිරික්සුමක් ඉදිරිපත් කර නොතිබුණි.	2025 මූල්‍ය වර්ෂයේ සිට ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	සමූහය සඳහා ඒකාබද්ධ ශේෂ පිරික්සුමක් ඉදිරිපත් කළ යුතුය.

1.5.1.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බෝපත්තලාව ගොවිපොළෙහි අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.13,633,311 වුවද විගණනයට ඉදිරිපත් කර ඇති උපලේඛණය අනුව ශේෂය රු.16,966,645 ක් වීමෙන් ශේෂ අතර රු.3,333,334ක වෙනසක් නිරීක්ෂණය වුවද අදාල වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.	වෙනසක් නොමැති බව දන්වමි.	උපලේඛණ සහ මූල්‍ය ප්‍රකාශන ශේෂයන් නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ආ)	මණ්ඩලයේ අනෙකුත් ජංගම වත්කම් ශේෂය රු.67,985,683 ක් වුවද ප්‍රධාන කාර්යාලය සහ ගොවිපළ වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව අනෙකුත් ජංගම වත්කම් ශේෂයන්හී එකතුව රු.77,582,060 ක් වූයෙන් ශේෂ අතර රු.9,596,377 ක වෙනසක් නිරීක්ෂණය වුවද අදාල වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.	ජංගම ගිණුම් ශේෂය අනෙකුත් ජංගම වත්කම් යටතේ දක්වා තිබීම සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී එය ගොවිපළ ජංගම ගිණුම් යටතේ දැක්වීම නිසා මෙම වෙනස ඇතිවී ඇත.	ගොවිපල ජංගම ගිණුම් ශේෂයන් සහ ප්‍රධාන කාර්යාලයේ ශේෂයන් නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

(ඇ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු වටිනාකම රු.4,218,655ක් වුවද, එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය ලෙස රු.1,466,557ක් දක්වා තිබීමෙන් ශේෂ අතර රු.2,752,098ක වෙනසක් වුවද අදාල වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.	සමාගම් දෙකෙහි ගනුදෙනු වල ඇතිවූ නොඑකගතාවයන් මත මෙම වෙනස ජනනය වී ඇත.	මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් තුල වෙළෙඳ ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය රු. 83,472,206 ක් වුවද ප්‍රධාන කාර්යාලය සහ ගොවිපළ වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව වෙළෙඳ ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයන්හී එකතුව රු.109,656,480 ක් වූයෙන් රු.26,184,274 ක වෙනසක් පැවතුනි.	ඇතැම් ගොවිපළ විසින් ජීව විද්‍යාත්මක වත්කම්හි වටිනාකම වෙළඳ ජීව විද්‍යාත්මක වත්කම් යටතේද, ඇතැම් ගොවිපළ ප්‍රාග්ධන ජීව විද්‍යාත්මක වත්කම් යටතේද නිරූපනය කරනු ලබයි.	අනුරූපී වාර්තා නිවරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

1.5.1.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 31 දිනට කන්තලේ ගොවිපොළට අදාළව මණ්ඩලය සතුව ඇති රු. 885,470 ක ඉතිරිකිරීමේ බැංකු ගිණුම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා අදාළ බැංකු පාස්පොත හෝ බැංකු ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවුණි.	මේ සම්බන්ධයෙන් කන්තලේ බැංකුව වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත	ඉතිරිකිරීමේ බැංකු ගිණුම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා අදාළ බැංකු පාස්පොත හෝ බැංකු ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ප්‍රධාන කාර්යාලය, වැලිසර කිරි ව්‍යාපෘතිය සහ ගොවිපොළ වල පවතින එකතුව රු.33,573,949 ක් වූ වෙළෙඳ හා අනෙකුත් ණයහිමි ශේෂ 31 ක් සඳහා ශේෂ සනාථනයන් විගණනය විසින් යවා තිබුණද එම ශේෂ සනාථනයන් විගණනයට ඉදිරිපත් නොවුණි.	එකඟ වේ. ප්‍රධාන කාර්යාලය සහ වැලිසර කිරි ව්‍යාපෘතිය පෙර වර්ෂවල ණයහිමි ශේෂ සනාථ කරගැනීම සඳහා ශේෂ සනාථන ලිපි යොමුකලද ඒවාට පිළිතුරු ලැබී නොමැත.	ශේෂ සනාථනයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2022 දෙසැම්බර් 31 දිනට ඔයගම ගොවිපොළෙහි රු.2,411,823ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ශේෂය හා වැලිසර ගොවිපොළෙහි රු.17,087,169 ක් වූ ණයහිමි ශේෂය වෙනුවෙන් ශේෂ උපලේඛනයක් සහ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.	අදාළ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.	ශේෂ සනාථනයන් හා කාල විශ්ලේෂණයන් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.

(ඈ)	වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් ගොවිපොළ 03 ක එකතුව රු. 8,332,629 ක් වූ ටෙන්ඩර් තැන්පතු සඳහා උපලේඛණ හෝ ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූණි.	ටෙන්ඩර් තැන්පතු ශේෂයට අදාළ ලේඛන මේ සමග ඉදිරිපත් කරමි.	උපලේඛණ හෝ ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	වැලිසර කිරි ව්‍යාපෘතියේ සහ ගොවිපොළ වලට අදාලව එකතුව රු.10,857,281ක් වූ වෙළෙඳ හා අනෙකුත් ණයගැති ශේෂ 19 ක් සඳහා බාහිර ශේෂ සනාථනයන් විගණනයට ඉදිරිපත් නොවුණි.	2024 වර්ෂයේ සිට සියළු ණයගැති ශේෂ සඳහා ශේෂ සනාථන ලිපි ලබා දීමට කටයුතු කරන බව දන්වමි.	උපලේඛණ හෝ ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඊ)	2013 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු.16,566,783ක් වූ විලම්භිත වියදම් ශේෂය සම්බන්ධව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.	මෙම වියදම විමර්ශනයක් කර පොත් වලින් ලියා හැරීමට කටයුතු කරනු ලැබේ.	තොරතුරු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.2. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 25 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී කළමනාකරණය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුවක් සිදු කළ යුතු අතර එසේ අඛණ්ඩ පැවැත්මක් නොමැති බවට සිද්ධීන් හා තත්වයන් පවතී නම් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කිරීම් කළ යුතු වුවද 2020 ජුනි මස 10 දින අංක අමප/20/0890/217/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සමාගම,ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණයක් ගෙන තිබියදී සහ ඈවර කිරීමේ කටයුතු ආරම්භකර ඇති පසුබිමක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි ඒ පිළිබඳ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඈවර කිරීමේ පදනම (Liquidation Basis) මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් සිදුකළ යුතු වුවද අඛණ්ඩ පැවැත්ම යටතේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.	සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.1.2 යටතේ සමාගම අඛණ්ඩ පැවැත්මක් තිබෙන බව දක්වා තිබු ඡේදය නිවැරදි කිරීමට කටයුතු කරන අතර , 2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඈවර කිරීමේ පදනම මත පිළියෙල කිරීමටත් හා ඒ පිළිබඳ හෙළිදරව් කිරීමටත් කටයුතු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී කළමනාකරණය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුවක් සිදු කළ යුතුය.

(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 හි 17 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අනුමත කළ දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දිනය එසේ හෙළිදරව් කර නොතිබුණි.	ගිණුම් ප්‍රකාශන පිළියෙළ කර අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කිරීම සඳහා, සමාගමට අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණු බැවින් කෘෂිකර්ම ,පශු සම්පත් , ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය යටතේ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව කළමනාකාරීත්වය විසින් සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැලපුම් නොකිරීම නිසා පිරිවැය රු.40,241,059 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ දේපළ පිරියත හා උපකරණ තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද අදාළ වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.	සමාගම ඈවර කිරීමේ කටයුතු ආරම්භකර ඇති බැවින් ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය.
(ඈ)	කොළඹ බාන්ස් පෙදෙසේ පිහිටි වටිනාකම රු.22,500,000ක් වූ ගොඩනැගිල්ලේ පිරිවැය ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණද ඊට අදාල රු.1,125,000 ක්වූ වාර්ෂික ක්ෂය ගිණුම් ගතකර නොතිබුණි.	ඉදිරියේදී එම නිවසේ වටිනාකම හඳුනා ගැනීම සඳහා ප්‍රත්‍යාගණනයක් සිදුකර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි.	වත්කම් සඳහා වාර්ෂික ක්ෂය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඉ)	2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ශේෂය රු.6,610,335ක් වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද ණයගැති වයස් විශ්ලේෂණය අනුව ඉන් වසර 5ක් ඉක්මවූ ශේෂ රු.5,274,879 ක්ද වසර 10ක් ඉක්ම වූ ශේෂ රු.1,335,456 ක්ද විය. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එකතුව රු 7,945,791 ක් ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත තත්වයේ පැවතුණද එම ශේෂ වෙනුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 හි 5.5.15 ඡේදය අනුව හානිකරණ ගැලපීම් සිදුකර නොතිබුණි.	මෙම ශේෂ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 හි 5.5.15 ඡේදය අනුව හානිකරණ ගැලපීම් සමාගමේ ඈවරකරුගේ උපදෙස් මත ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි.	අවිනිශ්චිත තත්වයේ පැවතින ණයගැති ශේෂ වෙනුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව හානිකරණ ගැලපීම් සිදු කළ යුතුය.

(ඊ)	2022 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සීමාසහිත කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු ශේෂ ලෙස රු.4,218,655ක ශේෂයක් පෙන්නුම් කළද සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය වෙත ගෙවිය යුතු ශේෂය වශයෙන් රු.3,108,595ක් පමණක් දක්වා තිබීම හේතුවෙන් රු.1,110,060 ක වෙනසක් පැවතියද ඒ පිළිබඳ සොයාබලා නිරවුල් කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට සීමාසහිත කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම මණ්ඩලයේ ගොවිපළක් ලෙස කටයුතු කරන අතර එයින් ඇතිවෙන ගණුදෙනු ජංගම ගිණුමක් හරහා සිදු කරයි. සීමාසහිත කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමේ ඇවර කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.	ශේෂ අතර පවතින වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කළ යුතුය.
(උ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ වශයෙන් එකතුව රු.3,356,129 ක් දක්වා තිබුණද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමට ගෙවිය යුතු වශයෙන් කිසිදු වටිනාකමක් පෙන්නුම් කර නොතිබුණද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම මුදල මෙතෙක් නොලැබී ඇති අතර, සමාගමේ ඇවර ක්‍රියාවලියත් සමග විසඳා ගැනීමට හැකි වනු ඇත	මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන අනුව රු. 28,288,290ක් වූ සේවක ණයගැති ශේෂය තුල ඇතුලත් රු.1,541,111ක් වූ වසර 05 ඉක්මවූ ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.	මෙම ණයගැති ශේෂ අයකර ගැනීමට හෝ තොරතුරු සොයාගත නොහැකි ශේෂ පොත් වලින් ලියා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශන අනුව රු.193,335,673ක් වූ වෙළඳ හා වෙනත් ණයගැති ශේෂය තුල ඇතුලත් රු.75,189,109 ක් වූ වසර 05 ඉක්මවූ ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. තවද රු. 50,592,451 ක් වූ වසර 05 ඉක්මවූ ප්‍රධාන කාර්යාලීය වෙළඳ හා වෙනත් ණයගැති ශේෂය තුල ඇතුලත් රු.47,383,352 ක ශේෂය 2024 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.17,768,743ක ණයගැති ශේෂ 5 ක් සම්බන්ධයෙන්	අදහස් දක්වා නොමැත.	ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	නීතිමය කටයුතු සඳහා යොමු කර තිබූ නමුත් එමගින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ණයගැති ශේෂයක් අයවී නොතිබුණි.		
(ඈ)	මූල්‍ය ප්‍රකාශන අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ආදායම් බදු සහ රඳවාගත් බදු එකතුව රු.2,257,460 ක් සහ රු.9,020,139 ක් වූ ලැබිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙන නොතිබුණි.	මෙම ශේෂය වසර ගණනාවකට පෙර පැවත එන ශේෂයක් වන අතර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ පවතින ශේෂයන් සමඟ සැසඳීම් කර ඉදිරියේදී නිවැරදි කරමි.	මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	රොෂිටා ගොවිපළෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති 2014 වර්ෂයේ සිට පැවත එන කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 1,460,561 ක් වූ ඉන්ධන බිල්පත් වර්තමානය වන විටත් අයකර ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව මගින් නියම කළ විමර්ශනය සිදු කර තිබෙන අතර එම කමිටුවෙන් ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතයි.	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුල ඇති වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය යටතේ වූ වෙළෙඳ ණයහිමි ශේෂයන්හි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක සිට පැවත එන එකතුව රු. 132,942,034 ක් සහ වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 57,227,417 ණය ශේෂ පැවතිණි.	මෙම ණයහිමියන් සඳහා කොටස් වශයෙන් පියවීම් සිදුකර ඇත.	ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික පනතේ 2 වන වගන්තිය හා 1975 පෙබරවාරි 14 දිනැති	මහබෙරියතැන්න පිහිටි පර්චස් 517 ක ඉඩමක් හා වැලිසර පිහිටි පර්චස් 31ක ඉඩමක් පිලිවෙලින් රු. 29,418,300ක	අමාත්‍ය මණ්ඩල අංක අමප/1192/145 (5) දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මහබෙරියතැන්න	මණ්ඩලය සතු ඉඩම් බදු දීමේදී පනත හා ගැසට් පත්‍රය මගින් සිදුකර ඇති සංශෝධනයන්ට අනුව, මණ්ඩලය විසින් ඉටු කළ

	අංක 157 දරන ගැසට් පත්‍රය	ප්‍රතිෂ්ඨාවකට වසර 99කට හා රු.31,600,800ක ප්‍රතිෂ්ඨාවකට වසර 30 කට පෞද්ගලික සමාගම් දෙකකට මණ්ඩලය විසින් ගැසට් පත්‍රයෙහි සඳහන් ඉටු කළ යුතු කාර්යයන්ට අදාළ නොවන කටයුතු සඳහා ගිවිසුම්ගත වී බදු දී තිබුණි.	ගොවිපලෙන් අක්කර 517 ක් 1996 සිට වසර 99 දක්වා පෞද්ගලික ආයතනය වෙත බදු පදනම මත නිදහස් කර ඇත. තවද ආයෝජන මණ්ඩලයට (BOI) අයත් ආයෝජන පහසුකම් සැපයීම සඳහා පත් කරන ලද කැබිනට් අනුකාරක සභා රැස්වීමේදී පෞද්ගලික සමාගමට මෝස්තර නිරූපණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වැලිසර ගොවිපලෙන් ඉඩම් අක්කර 03 පර්චස් 0.31 (හෙක්ටයාර 1.2152)ක් ලබාදීමට එවකට සිටි ජනාධිපතිවරයා තීරණය කර ඇත.ඒ අනුව 2006.09.05 දිනැති 374 වන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව වසර 30 කට එම ආයතනය වෙත ගිවිසුමක් යටතේ බදු පදනම මත නිදහස් කර ඇත.	යුතු කාර්යයන්ට අදාළ වන කටයුතු සඳහා ලබාදිය යුතුය.
(ආ)	1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 5 (1) වගන්තිය	සේවයෙන් ඉවත් වී දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවා අවසන් කළ යුතු වුවත්, 2021 හා 2022 වර්ෂවලදී සේවයෙන් ඉවත් වූ සේවකයන් 17 දෙනෙකු හා සේවකයින් 32 දෙනෙකු සඳහා පිලිවෙලින් රු.1,020,938 ක් හා රු.5,246,568 ක් ගෙවිය යුතුව තිබුණි.	2022 වර්ෂයේ අගභාගයේදී සේවයෙන් ඉවත්වූ සේවකයන්ගේ පාරිතෝෂිත මෙලෙස ගෙවියයුතු යටතේ දක්වා ඇත.	පනත ප්‍රකාරව නියමිත දින වලදී පාරිතෝෂික දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 නොවැම්බර් 16 දින අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර	ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත්	නියමිත කාලපරිච්ඡේදය තුල මූල්‍ය ප්‍රකාශන	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනවලදී මූල්‍ය ප්‍රකාශන විගණනය

චක්‍රලේඛය මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශයේ 6.6 වගන්තිය	වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2025 මාර්තු 12 දිනදීය.	පිළියෙල කිරීම අවසන්කර තිබු නමුත් පෙර වර්ෂ කිහිපයක මූල්‍ය වාර්තා විගණනය කර නොතිබූ බැවින් විගණනයට භාරදීමට හැකියාවක් නොතිබුණි. මෙම ප්‍රමාදය ඊට ප්‍රධාන හේතුවක් විය.	වෙත ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හා එහි පරිපාලිතයෙහි මෙහෙයුම් ප්‍රතිඵලය රු. 125,982,339 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.173,420,993 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,438,654 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන, බෙදාහැරීමේ සහ අනෙකුත් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 13 කින් වර්ධනය වී තිබුණු අතර ඊට සාපේක්ෂව විකුණුම් පිරිවැය සියයට 33 කින් වැඩි වී තිබුණි. ජීව විද්‍යාත්මක වත්කම් හි සාධාරණ අගය ඉහළ යාම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 3770 ක් විය. සමාගමේ දළ ලාභ අනුපාතය සියයට 3කින් අඩු වී තිබුණු අතර අනෙකුත් ආදායම් සියයට 98 කින් වර්ධනය වී තිබුණි. තවද මණ්ඩලයේ බෙදාහැරීමේ වියදම් සියයට 36ක්, පරිපාලන වියදම් සියයට 14 ක්, සහ අනෙකුත් වියදම් සියයට 42 කින් වර්ධනය වී පැවති බව නිරීක්ෂණය විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැලිකන්ද ගොවිපොළෙහි කළමනාකරුගෙන් අයවිය යුතු රු.619,485 ක් වූ මුදල් හිඟතාවයක් හා රු.10,287,510ක් වූ ජීව විද්‍යාත්මක වත්කම් හිඟතාවයක් ලෙස එකතුව රු.10,906,995ක් පැවතියද මේ වන විට එම පුද්ගලයා ජීවත්ව නොමැති බැවින් එම මුදල අයකරගැනීමේ ශක්‍යතාවක් නොමැති අතර ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මේ සම්බන්ධ වංචා විමර්ෂණ අංශයේ පැමිණිල්ලක් විභාග වන අතර වගකිව යුත්තන් මේ වනතෙක් නිශ්චිතව හඳුනාගෙන නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇත. වංචා විමර්ශන අංශයේ අදාල කාර්යභාරය අවසන් වූ පසු එහි නියමයන්ට අනුකූලව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	මිරිස්වත්ත ගොවිපොළෙහි 2022 සැප්තැම්බර් 7 සහ 8 යන දින වලදී සිදුවූ අභිජනන කුකුළන් 1,726 ක අස්ථානගතවීම නිසා ඇතිවූ රු.5,351,366 ක් වූ සම්පත් හිඟයට අදාළ මුදල් වර්තමානය වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද නිකවැරටිය අලෙවිසැලෙහි වටිනාකම රු. 751,243 ක් වූ විකුණුම් හිඟතාවය පිළිබඳ පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් මණ්ඩලය මගින් විමර්ශනයක් සිදුකරනලද අතර පොලිසියේ පැමිණිල්ලක් විභාග වෙමින් පවතී. අවශ්‍ය කටයුතු අවසන් වූ වහාම අදාළ පුද්ගලයන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි.	විධිමත් පරීක්ෂණ පවත්වා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මාරවිල හා මිරිස්වත්ත ගොවිපොළවල සහ ප්‍රධාන කාර්යාලයට අදාලව එකතුව රු.30,191,157 ක් වූ තැන්පතු ශේෂයෙන් 2020 වර්ෂය දක්වා කුකුළු පැටවුන් සඳහා ලබාගත් විකුණුම් අත්තිකාරම් සහ ටෙන්ඩර් තැන්පතු 525 කට අදාල එකතුව රු. 14,203,784 ක තැන්පතු ශේෂයන් නිරවුල් කිරීමට 2022 දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.	මාරවිල සහ මිරිස්වත්ත ගොවිපොළවල ඇප තැන්පතු තබා ඇති ගනුදෙනුකරුවන් වර්තමානයේද තබා ඇති ඇප තැන්පතු වටිනාකම ගණුදෙණු සිදුකරනු ඇත.	ගනුදෙනු සිදු කරනු නොලබන ඇප තැන්පතු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා මහ බැංකු වාර්ෂික වාර්තා අනුව 2022 හා 2023 වර්ෂ තුළ රටෙහි සමස්ත කිරි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර 506,449,602 ක් හා 504,153,360 ක් වූ අතර පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,391 ක් හා මිලියන 3,170 ක් විය. 2022 හා 2023 වර්ෂ සඳහා එයින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර 7,062,151 ක් හා 5,552,862 ක් වූ අතර පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 18 ක් හා මිලියන 14 ක් විය. ඒ අනුව මණ්ඩලයේ දායකත්වය 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් කිරි නිෂ්පාදනයෙන් සියයට 1.39 ක් හා 1.10 ක් වූ අතර පොල් නිෂ්පාදනයෙන් සියයට 0.52 ක් හා 0.44 ක් තරම් ඉතා පහළ මට්ටමක පැවතුනි. තවද ඇසුරුම් කළ දියර කිරි වෙනුවෙන් වෙළඳපල තුළ ඉහළ ඉල්ලුමක් ඇති අතර අනෙකුත් තරඟකාරී ආයතන එම වෙළඳපල අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කළද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය රටෙහි ප්‍රධානතම කිරි නිෂ්පාදකයා වුවත් එවැනි අවස්ථා උපයෝජනය තුළින්	මණ්ඩලයේ කිරි නිෂ්පාදනය රටේ නිෂ්පාදනයේ විශාල ප්‍රතිශතයක් ලෙස ඉහල නැංවීම ප්‍රයෝගික නොවේ. එනම් කිරි නිෂ්පාදනය දෙගුණ කලද එය රටේ නිෂ්පාදනයෙන් සියයට 3.5 ක් පමණ වනු ඇත. එසේ නමුත් පවතින සම්පත් උපරිමයෙන් භාවිතා කරමින් සීමිත මූල්‍ය හැකියාවන් මත හැකි උපරිමයෙන් තවදුරටත් නිෂ්පාදනය ඉහල නැංවීමට පියවර ගනු ලැබේ. 2022-2023 වර්ෂ වල පොල් වගාවට බලපාන ලද මයිටා හා සුදුමැස්සාගේ හානිය, රසායනික පොහොර හිඟතාවයද හේතුවෙන් පොල් නිෂ්පාදනය අඩුවිය. ඇසුරුම් කල දියර කිරි සඳහා අවශ්‍ය ඇසුරුම් ද්‍රව්‍ය රටෙහි පැවති ආනයනික සීමා හේතුවෙන් ආනයනය කිරිමට අපහසු වූ බැවින් නිෂ්පාදනය සිමාසහිත විය.	නිෂ්පාදනයන් තවදුරටත් වර්ධනය කර ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ.

	වර්තමාන කාලයට ගැලපෙන පරිදි කටයුතු කර වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.		
(ආ)	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළ 32 සතුව පවතින හෙක්ටයාර 11,379 ක සමස්ථ භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 9,159 ක් උපයෝජනය කරනු ලබන අතර හෙක්ටයාර 2,220 ක් උපයෝජනය නොකරන බව නිරීක්ෂණය විය. භාවිතා නොකරන භූමි ප්‍රමාණය තුළ වගුරු බිම්,අභ්‍යන්තර වන භූමි සහ පරිසර සංවේදී ස්ථාන, කඳු හා ගල් සහිත ස්ථාන පැවතිය ද තවදුරටත් සංවර්ධනයට යොදාගත හැකි එහෙත් සංවර්ධනයට යොදානොගත් හෙක්ටයාර 1,606 ක භූමි ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය.	උපයෝජනය නොකරන භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 1,606ක පමණ කොටසක් ආයෝජනය කර සංවර්ධනය කිරීමේ මට්ටමක පවතී. මෙම ඉඩම් දශක කිහිපයක් පුරා සංවර්ධනය කිරීමට නොහැකි වූයේ ආයෝජනය කිරීමට මූල්‍ය ශක්‍යතාවක් නොමැති වීම, අයිතිය ඉඩම් කොමසාරිස් සතු වීම,වන අලි ගැටලුව, ජල ගැටලුව, ආර්ථික අවපාතයන්, 2022 වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ මිල්කෝ ආයතනය ඒකාබද්ධ කර පෞද්ගලික ආයතනයක් පිහිටුවීමේ කැබිනට් තීරණයට අනුව නව ව්‍යාපෘති සිදු නොකරන ලෙස දැනුම්දීම ආදී හේතූන්ය.මේ දක්වා මෙම ඉඩම් හා ගොවිපළ සංවර්ධනය කිරීමට අවස්ථාවක් නොලැබුණි.	උපයෝජනය නොකළ ඉඩම් සංවර්ධනය කර උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ.
(ඇ)	මණ්ඩලය සතුව පවතින ගොවිපොළ 32 න් ගොවිපොළ 13 ක් 2022 වර්ෂය තුළදී එකතුව රු.496,420,776 ක අලාභ ලබා තිබුණි. තවද වර්ෂය තුළ අලාභ ලබා තිබූ මැණික්පාලම, රිදියගම, පොළොන්නරුව, මාටින් සහ එම්.එල්.ඩී.සී යන ගොවිපළවල් 05 ක් ආසන්න වසර 05ක කාලසීමාව තුළ අඛණ්ඩව එකතුව රු.1,585,584,049ක අලාභයක් ලබා තිබුණි. ඉහත ගොවිපළ 05 විසින් එකතුව හෙක්ටයාර 2,481ක භූමි ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි. ගොවිපොළවල් දිගුකාලීනව අලාභ ලැබීමට දුර්වල මෙහෙයුම් හා කළමනාකරණ අකාර්යක්ෂමතා බලපා තිබෙන බව නිරීක්ෂණය වේ.	රිදියගම, මැණික්පාලම සහ පොළොන්නරුව ගොවිපොළවල සතුන්ගේ ආහාර සඳහා යොදාගන්නා යෙදවුම් මිල අධික වීම තණකොළ පමණක් සැපයීමෙන් තොරව සාන්ද්‍ර ආහාර විශාල ලෙස ලබාදීමෙන් නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ වේ. මෙම ව්‍යාපෘති ලාභදායී කිරීමට ගොවිපොළවල නිෂ්පාදනය කරන කිරි තොග වශයෙන් අලෙවි නොකර අගය එකතු කළ කිරි ලෙස වෙළඳපොළට නිකුත් කළ යුතුය. නමුත් මණ්ඩලයේ කිරිවලින් සියයට 10ක ප්‍රමාණයක් අගය එකතුකළ නිෂ්පාදන ලෙස අලෙවිකරන බැවින් මහා පරිමාණ ගොවිපළවල් අලාභදායි ලෙස නඩත්තු කිරීමට සිදු වී ඇත. 2018-2022 කාලයේ රටේ පැවති තත්ත්වයන් හේතුවෙන් ගොවිපොළවල නිෂ්පාදනය හා සතුන්ගේ ශාරීරික තත්ත්වයන් සීඝ්‍ර ලෙස පහත වැටුනි. පොළොන්නරුව ගොවිපොළට ඉඩම් භාර දී තිබුණ ද විවිධ ව්‍යාපෘති සඳහා ඉඩම් නිදහස් කිරීම හේතුවෙන් මණ්ඩලය වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය නිරවුල් කර ඉදිරියේ දී හඳුනාගැනීමට කටයුතු කරනු ඇත. මාටින් ගොවිපොළ වෙළඳපොළ ඉල්ලුම අනුව නිරන්තර ලාභ අලාභදායී තත්ත්වයන් වෙනස්වන ගොවිපොළකි. සතුන් මිය යාම, ඵලදායිතාවය අඩුවීම, අභිජනන ක්‍රියාවලිය නතර කිරීම, පාරිභෝගික ඉල්ලුම පහත යාම	අලාභ ලබමින් පවතින ගොවිපළ ලාබදායි තත්වයට පත්කිරීම සඳහා පවතින සම්පත් ඵලදායි ලෙස උපයෝජනය කිරීමත් සහ කාර්යක්ෂමව මෙහෙයුම් කටයුතු සිදුකිරීමත් කළ යුතු වේ.

ආදිය මඟින් ව්‍යාපෘතිය අර්බුදයකට ලක්විය. එම්.එල්.ඩී.සී ගොවිපොළ පුහුණු මධ්‍යස්ථානයක් වන අතර කොරෝනා වසංගතය සහ සංචරණ සීමා හේතුවෙන් පුහුණු වැඩසටහන් විශාල සංඛ්‍යාවක් අවලංගු වීම හේතුවෙන් මණ්ඩලයේ වියදමින් නඩත්තු කිරීමට සිදු වුවද, පසුකාලීනව ලාභදායී තත්ත්වයන් යටතේ පවත්වාගෙන යනු ලබයි.